# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
# බඳවා ගැනීම්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා ගණකාධිකාරී හා වැඩසටහන් නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමට, සුදුසුකම් ඇති ශ්‍රී ලාංකේය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පොදු සුදුසුකම්**

(i) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට,
ගණකාධිකාරී - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි;
වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්/තොරතුරු) - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.
(රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

(iv) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයක් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**03. එක් එක් තනතුරට අදාල තොරතුරු**

| | |
|---|---|
| 3.1 තනතුරු නාමය | **ගණකාධිකාරී** |
| 3.1.1 වැටුප් පරිමාණය | MM 1-1- 2016 :- රු. (53,175 - 10X 1,375 - 15 X 1,910 - 95,575) කළමනාකරණ සේවා 2/2016 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ. |
| 3.1.2 සුදුසුකම් | <u>බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් i හෝ ii)</u><br>(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ගණකාධිකරණ/ කළමනාකරණ හෝ වාණිජ ක්ෂේත්‍රය තුළ ලබා තිබීම.<br>සහ<br>උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මාධ්‍ය සහතික පත්‍ර පරීක්ෂණය සමත්වීම සහ එකී සුදුසුකම ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම<br><br><u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත i හෝ ii)</u><br>(i) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br>(ii) " කණිෂ්ඨ කළමනාකාර " JM සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

| | |
|---|---|
| 3.2 තනතුරු නාමය<br>3.2.1 වැටුප් පරිමාණය<br>3.2.2 සුදුසුකම් | **වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)**<br>MA4-2016 (37,970-755x10-930x15-1,135x5-65,145/-) කළමනාකරණ සේවා 2/2016 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.<br>(අ) පහත දැක්වෙන ක්ෂේත්‍රයන්ගෙන් එකක් පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම. (අධ්‍යාපනවිද්‍යාව, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය, සමාජ විද්‍යාව)<br>(ආ) අතිරේක සුදුසුකම්<br>(i) පර්යේෂණ හා සමීක්ෂණ කිරීම පිළිබඳ පළපුරුද්ද<br>(ii) ව්‍යාපෘති හෝ වැඩසටහන්වල පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ පළපුරුද්ද<br>(iii)ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට ඇති හැකියාව |
| 3.3 තනතුරු නාමය<br>3.3.1 වැටුප් පරිමාණය<br>3.3.2 සුදුසුකම් | **වැඩසටහන් නිලධාරී (තොරතුරු)**<br>MA4-2016 (37,970-755x10-930x15-1,135x5-65,145/-) කළමනාකරණ සේවා 2/2016 චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.<br>(අ) පහත දැක්වෙන ක්ෂේත්‍රයන්ගෙන් එකක් පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම. (අධ්‍යාපනවිද්‍යාව, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය, සමාජ විද්‍යාව)<br>(ආ) අතිරේක සුදුසුකම්<br>(i) පර්යේෂණ හා සමීක්ෂණ කිරීම පිළිබඳ පළපුරුද්ද<br>(ii) ව්‍යාපෘති හෝ වැඩසටහන්වල පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ පළපුරුද්ද<br>(iii)ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට ඇති හැකියාව |

අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017 නොවැම්බර් 10 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක 126, නාවල පාර, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

*සැලකිය යුතුයි. - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාලය දැනට අංක 126 නාවල පාර, නුගේගොඩ යන ස්ථානයේ ස්ථාපනය කර ඇති අතර ශාඛා කාර්යාල නොමැත.

මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළකර ඇත. භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා දැන්වීම වලංගු වෙයි.

මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
නො.126, නාවල පාර,
නුගේගොඩ